# Abstract 35

## දන්සැල් පැවැත්වීම පිළිබඳ බෞද්ධ සංස්කෘතික දැක්ම

**ඩබ්. ආර්. විසාකා මල්කාන්ති විජේරත්න,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර-බෞද්ධ සංස්කෘතිය),
*wimansasamanalee@gmail.com*

දන්සැල් පැවැත්වීම නූතන ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතියේ විශේෂ අංගයකි. මෙය දින වකවානු විනිශ්චයකින් තොරව බුදුන් දවස ද සිංහල රජ දරුවන් විසින් ද ක්‍රියාවට නංවන ලද, අන්‍ය ජාතිකයන් මවිතයට පත් කරවන විශේෂ සච්චාරිත්‍රයක් වේ. **සුනාමිය** වැනි ව්‍යසනාපන්න අවස්ථාවන්හි දී එයින් ගොඩ ඒම සඳහා ඉවහල් වූයේ කාලාන්තරයක් තිස්සේ ජාතියක් වශයෙන් ප්‍රගුණ කරන ලද මෙම සංස්කෘතික භාවිතය යි. දන්සැල් පැවැත්වීම ආගමික භාවිතයක් මෙන් ම එය ශ්‍රී ලාංකිකයාගේ ජාතික ලක්ෂණයක් ද වේ. මෙමගින් දුප්පතුන් විෂයයෙහි පිහිටවීමක් මෙන් ම පොදු ජනයාගේ භාව විශෝධනයක් ද දැහැමි විනෝදයක් ද ඇති වන අතර අප්‍රකට වශයෙන් මෙරට කුඩා ව්‍යාපාරිකයාගේ සිට මහාපරිමාණ ව්‍යාපාරිකයා දක්වා ආර්ථික ක්‍රියාවලියට දායකත්වයක් ද සැපයේ. ජාතික සමගිය, එකමුතුකම, සාමූහික තීන්දු තීරණ ගැනීමේ පෙළඹවීම යනාදී ප්‍රතිලාභ රාශියක් දීර්ඝ කාලයක් තිස්සේ මෙමගින් ශ්‍රී ලංකික සමාජයට ප්‍රදානය කර ඇත. දන්සැල් පැවැත්වීම ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතිය තවදුරටත් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකමක් වේ. එහෙත් වර්තමානය වන විට දන්සැල් පැවැත්වීම නැමැති උත්තුංග කාර්යය තවදුරටත් පැවැත්වීම අභියෝගයට ලක් කරමින් ගැටලු කීපයක් නිර්මාණය වී ඇත. මූල්‍යමය වංචා, හිංසනය, බලහත්කාරකම්, සෞඛ්‍යමය නො සළකා හැරීම් යනාදිය ඒවා අතර වේ. මෙතෙක් උසස් අධ්‍යාත්මයකින් සමාජය විසින් පවත්වා ගෙන ගිය දන්සැල් සඳහා රජය විසින් නීතිමය බලපෑම් ද එල්ල කරන තත්ත්වයක් ද උදාවී ඇත. මෙහි ප්‍රතිලාභ බුද්ධිමය වශයෙන් සලකා බලන රජයක් විසින් එසේ නීතිමය වැටකඩොලු බැඳීමට වඩා කළයුතු වන්නේ එම ගැටලු උද්ගතවීමට බලපා ඇති සාමාජික, ආගමික හා දේශපාලනික ප්‍රභවයන් හඳුනා ගැනීම යි. අඩපණ වෙමින් පවතින දන්සැල් දීමේ සංස්කෘතිකාංගය විධිමත් ලෙස සක්‍රීය කිරීම සඳහා සංස්ථාවක් වශයෙන් අවම වශයෙන් ප්‍රාදේශීය භික්ෂූන් පුමුඛ බෞද්ධ සංවිධාන මඟින්වත් බුද්ධිමය සාකච්ඡාවකට එළඹිය යුතු ය.

**ප්‍රමුඛ පද :** ආහාර පාන, එකමුතු බව, දන්සැල්, බෞද්ධ සංස්කෘතිය, වංචා